**බලංගොඩ ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම සඳහා වැය කරන ලද රු.10,018,820ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | පරිත්‍යාග වශයෙන් ලද ස්ථාවර වත්කම් රු.8,012,045ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය මඟින් ගලපා නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සභාව සතු බැකෝ යන්ත්‍රය ජනදිරිය වැඩසටහන හා වෙනත් සුභසාධන කටයුතු සඳහා ලබාදීමට අදාළව රු.3,612,605ක උපකල්පිත කුළී ආදායමක් හා වියදමක් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |
| (ඈ) | හිඟහිටි ආදායම් රු.770,685ක් වැඩියෙන් දක්වා තිබුණි. | අතපසුවීමකි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,267,712ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,653,255ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,378,381 | 1,083,059 | 1,030,861 | 134,681 | 1,833,380 | 1,051,400 | 1,080,234 | 100,845 |
| කුලී | 9,091,650 | 6,222,837 | 5,934,426 | 86,057 | 8,414,900 | 4,517,336 | 4,262,890 | 244,839 |
| බලපත්‍ර ගාස්තු | 905,500 | 881,370 | 896,120 | - | 588,500 | 1,021,960 | 922,580 | - |
| වෙනත් ආදායම් | 5,489,500 | 11,573,436 | 10,908,834 | - | 4,335,500 | 5,617,773 | 5,716,706 | 345,684 |
| | 16,865,031 | 19,760,702 | 18,770,241 | 220,738 | 15,172,280 | 12,208,469 | 11,982,410 | 691,368 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 03කට වඩා පැරණි රු.49,814ක හිඟහිටි අක්කර බදු ශේෂයක් ද, වසර 01ත් වසර 17ත් අතර කාලයක් පැරණි රු.21,300ක බිම් බදු ශේෂයක් ද, 2022 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. එමෙන්ම, යකහළු මූකලාන ඉඩමේ බිම්බදු පදනම මත ලබා දී තිබුණු බිම් කොටස් 19ක් සඳහා තක්සේරු වාර්තා නොතිබුණි. | මේ වන විට අක්කර බදු අයකර ගැනීම සඳහා සතොක්ෂණයක් සිදු කරමින් පවතින බවත් යකහළු මූකලාන බිම් කොටස්වලට අදාල හිඟ මුදල ඉදිරියේ දී අයකරගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වෙළිඔය ආර්ථික මධ්‍යස්ථානයේ කඩකාමර 02කින් හා දුවිලි ඇල්ල සංචාරක මධ්‍යස්ථානයේ කඩකාමරයකින් හිඟහිටි රු.64,756ක් ගිවිසුම් ඇප මුදලින් හෝ අයකර නොතිබුණි. | හිඟ කුලිය ඉදිරියේ දී අයකරගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා හිඟහිටි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු රු.27,000ක් හා 2021 හා 2022 වර්ෂ සඳහා අයවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.169,260ක් අයකර නොතිබුණි. එමෙන්ම, ප්‍රදර්ශිත දැන්වීම් පුවරු හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | හිඟ මුදල් ගෙවන ලෙස දන්වා අදාළ ආයතන වෙත ලිපි යොමු කර ඇති බව හා 2023 වසරේ දී සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොල්වතුගොඩ, මහවලතැන්න ඉඩමේ සමෝච්ඡ රේඛා සිතියම හා භූමි යෝග්‍යතා සහතිකය ලබා ගැනීමට 2021 හා 2022 වර්ෂවල දී රු.183,124ක් ගෙවා තිබුණ ද, 2023 ජනවාරි දක්වාම එම කාර්යයන් ඉටු වී නොතිබුණි. මේ නිසා ඉඩම පවරාගත නොහැකි වීමෙන් රාස්සගල කුඩා නගර සංවර්ධන සැලැසුම ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. | මෙම ඉඩම සභාවට අත්පත් කරගැනීම සඳහා අදාළ ආයතන වෙතින් නිර්දේශ ලබා ගැනීමට ලිපි යොමු කර ඇත. | අදාළ ඉඩම පවරාගෙන නගර සංවර්ධන සැලැස්ම කඩිනමින් ක්‍රියාවට නැංවිය යුතුවේ. |
| (ආ) | වෙළිඔය නගරයේ 2015 වර්ෂයේ දී ඉදිකළ රු.27,253,473ක් වූ දෙමහල් ගොඩනැගිල්ල 2022 වර්ෂය අවසන් වනවිටත් අභාවිතව පැවැතිණි. | ගොඩනැගිල්ල සංවර්ධනය සඳහා ණය මුදලක් ලබා ගැනිමට ගිවිසුම් අත්සන් කර දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත යවා ඇති බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුවේ. |
| (ඇ) | අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණි. 2021 සහ 2022 වර්ෂ තුළ හඳුනාගත් අනවසර ඉදිකිරීම් 29ක් නියමානුකූල කර ගන්නා ලෙස දන්වා යවා තිබුණ ද, ඒ පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් ලේඛනගත කර ක්‍රියාමාර්ග ගන්නා බවත්, පසුවිපරම් සිදු කර වාර්තා ලබාගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කරමින් පවතින බව. | අනවසර ඉදිකිරීම් නියමානුකූල කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | සමිති 58ක් වෙත රු.830,300ක හියුම් පයිප්ප ලබා දී තිබුණ ද, ඒවා අරමුණුගත කාර්යයන් සඳහා යෙදවූයේ ද යන්න පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි. | මේ පිළිබඳව පසුවිපරමක් සිදු කරන බව. | නොපමාව පසුවිපරම් කළ යුතු වේ. |
| (ඉ) | රැස්කළ අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැර කර නොතිබුණු අතර 2022 අගෝස්තු මාසයේ දී පළාත් සභාවෙන් ලද රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය තෙකලා විදුලිය නොමැති වීමෙන් ලද දින සිට අභාවිතව පැවතුණි. | බෙලර් යන්ත්‍රය තෙකලා විදුලිය නොමැතිවීම මත භාවිතා කිරීමට නොහැකි වී ඇති බව. | සන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බව. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට නීතිඥ සේවා ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව හා විධිමත් ගිවිසුමකට එළැඹීමකින් ද තොරව මහා සභාවේ අනුමැතිය මත නීතිඥවරයෙකු තෝරා පත්කර ගෙන තිබුණි. | ඉදිරියේ දී ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව විධිමත් ගිවිසුමකට එළැඹීමෙන් නීතිඥවරයෙකු තෝරා පත් කර ගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------- | ------------ |
| සභාව තුළ ලී වේදිකාවක් සැකසීම සඳහා සබරගමු පළාතේ ලංසුකරුවන්ට පමණක් සීමාවන ලෙස පුවත්පත් දැන්වීම් පළකර තිබීමෙන් සුදුසුකම්ලත් සියලු ලංසුකරුවන්ට ඉදිරිපත් වීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | සබරගමුව පළාත තුළ සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන් සිටීම සහ ඉදිකිරීම් කටයුතුවල පහසුව පිණිස පළාතේ ලංසුකරුවන් වෙනුවෙන් දැන්වීම් පළකළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |